www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුධ ආර්ථිකය ශ්‍රී ලාංකික කම්කරුවන් මතට දැඩි බරක් යොදයි

## War economy weighs heavily on Sri Lankan workers

**සමන් ගුනදාස විසිනි**
**2007 ජූලි 20**

කම්කරුවන් සහ දුගීන් මත තවදුරටත් පීඩාවන් ඇතිකරමින්, ශ්‍රී ලාංකා ආන්ඩුව මෑත සති කීපය තුල අත්‍යාවශ්‍ය භාන්ඩ කිහිපයකම මිල ගනන් ඉහල දමන ලදී. ලෝක තෙල් මිල වැඩිවීම සාධකයක් හැටියට පවතින අතරතුර රජය දෙමල ඊලාම් විමුක්ති කොටි සංවිධානයට එරෙහි උත්සන්න කෙරුනු යුද්ධයේ ආර්ථික බර කෙලින්ම ජනයා මතට කඩාපාත් කරයි.

ගිය වසරට වඩා 45% කින් වැඩි කරමින්, මේ වසරේ ආරක්‍ෂක වියදම රුපියල් බිලියන 139 (ඇ. ඩො. බිලියන 12) දක්වා ඉහල නංවා ඇත. කෙසේ වුවත් මිලිටරි ක්‍රියාකාරකම්වල තීව්‍රතාවයත් සමග ආරක්‍ෂක වියදම තවත් 50% කින් ඉහල යතැයි අපේක්‍ෂා කෙරේ.

සාමාන්‍ය වැඩකරන ජනතාවට මෙම බරපැන සහමුලින්ම ගෙවීමට බලකෙරී ඇත.

⋆ජූනි 29 වෙනිදා අවසන් වැඩි කිරීමෙන් හරියටම මාස දෙකකට පසුව ඉන්ධන මිල 5% කින් පමන ඉහල දැමුනේය. මේ වසර තුල දැනටමත් පෙට්‍රල් සහ ඩීසල් මිල 20% කින් සහ 18% කින් අනුපිලිවෙලින් 6 වතාවක් ඉහල දමා ඇත. ආලෝකකරනය හා ආහාර පිසීම සඳහා නාගරික හා ගම්බද දුගීන් විසින් පොදුවේ පාවිච්චි කරන භූමිතෙල් ලීටරයක මිල රු 67 දක්වා එනම් 31% කින් වැඩි කර ඇත.

⋆ජූලි 4 වනදා, අඩු වියදම් ප්‍රවාහන ක්‍රමයක් වන පුද්ගලික හා රාජ්‍ය බස් සේවා ඉන්ධන මිල ඉහල යෑමට සමානුපාතිකව ගාස්තු ඉහල දැම්මේය. මෙම ඉහල දැමීම 16% හා 33% අතරේ පරාසයකට විහිදුනි. දුම්රිය ගාස්තු සැප්තැම්බරයේදී නැංවීමට නියමිතය.

⋆ජූලි 9 වනදා, මේ වසරේදී දෙවන වතාවට එල්. පී. ගෑස් මිල 9% කින් එනම් කි. ග්‍රෑ. 125 සිලින්ඩරයක් රු. 87 කින් ඉහල ගියේය.

⋆පසුගිය මාසය තුල සාමාන්‍ය අඩු මිල වර්ගද ඇතුලත්ව කිරිපිටි මිල 25% කින් ඉහල ගියේය. මැයි මාසයේදී තිරිඟු පිටි මිල 16% කින් ඉහල යාමත් සමග පාන් ගෙඩියක මිල 12% කින් වැඩිවිය.

පැතිරුනු මහජන කෝපය නිසා ජීවන වියදම සඳහා වන කැබිනට් අතුරු කමිටුවේ මූලාසනය හිමි අගමැති රත්නසිරි වික්‍රමනායක, වැඩිවුන ඉන්ධන මිල සාධාරනීකරනය සඳහා ජූනි 29 වනදා, පුවත්පත් සාකච්ඡාවක් කැඳවූවේය. උතුරු නැගෙනහිර මිලිටරි ක්‍රියාකාරකම් සහ රටේ සංවර්ධන වැඩ සටහන් වලට පාඩු සිදුකරන්නට රජයට අවශ්‍ය නැතැයි ප්‍රකාශ කල ඔහු සියලුම චෝදනා ලෝක ඉන්ධන මිල මත පැටවීය.

වැඩ කරන ජනතාවගේ කෝපය සමනය කිරීමේ උත්සාහයක් ලෙසට, රජය සීනි පරිප්පු වියලි හාල්මැස්සන් සහ වියලි මිරිස් ඇතුලු මූලික භාන්ඩ දහයකින් වැට් බද්ද ඉවත් කරනු ඇතැයි වික්‍රමනායක පැවසීය. කෙසේවුවත්, ජූලි 10 වනදා, වැට් බදු ඉවත් කිරීමෙන් ඇතිවූ සීමිත මිල පහතවැටීම් නව රේගු බදු නිසා සිදුනොවනු ඇති බවට ආනයන කරුවෝ පැමිනිලි කලෝය.

"කැපකිරීම" ට රජයේම ඇති කැමැත්ත ඔප්පු කිරීමේ බලාපොරොත්තු සුන් වූ උත්සාහයක් ලෙස , 10% කින් වැටුප් කප්පාදු කරන්නට කැබිනට්ටුව තීරනය කල බව ජූලි 4 වනදා අතුරු කමිටුව නිවේදනය කලේය. සුවච කීකරු කොලඹ ජන මාධ්‍ය පවා එම තීරනය " විහිලුවක්" ලෙසට විස්තර කලේය. ජනවාරියේදී රාජ්‍ය සේවක වැටුප් ඉල්ලීම් ඉවත දමමින්, පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ඇමති වැටුප් 120% කටත් වැඩියෙන් ඉහල දැමීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ හා සිය කැබිනට්ටුව ක්‍රියා කලෝය.

ඉන්ධන දීමනා, ලේකම්වරු හා බංගලා ඇතුලු වෙනත් බොහෝ දීමනා ඇමතිවරුන් අත්හල යුතුයැයි කිසිඳු යෝජනාවක් ඉදිරිපත් වී නැත. තම දුර්වල පාලක සන්ධානය නඩත්තු කිරීම සඳහා රාජපක්ෂ රජයේ සියලුම මන්ත්‍රීවරුන්ට කුමන හෝ ඇමතිකමක් ලබාදුනි. ඇමතිවරු 108 කගේ වාර්ෂික වියදම අඩුම තරමින් රු.

බිලියන 2 කි. මෙහි සාමාන්‍ය අගය, බොහෝ ශ්‍රී ලාංකිකයනට ලඟා කරගත නොහැකි වාසනාවක් වන රු. මිලියන 18.5 හෝ ඇ. ඩොලර් 165000 කි.

යුද්ධය උද්ධමනය ඉහල නංවන අතර, ආර්ථික අසමතුලිතතාව ඇති කරයි. මෙම තත්වය ආරක්ෂක වියදම් හැර, අනෙකුත් සියලුම රාජ්‍ය වියදම් කප්පාදු කිරීමට හේතු වේ. ජූනි 24 වනදා, සන්ඩේ ටයිම්ස් පුවත්පතේ ආරක්ෂක ලිපි සම්පාදක ඉක්බාල් අතාස් වාර්තා කරන ලෙසට, භාන්ඩාගාරයේ මුදල් නොමැති බව මුදල් අමාත්‍යාංශ ලේකම් පී බී ජයසුන්දර ජාතික ආරක්ෂක සභාවට දැනුම් දී තිබේ. "වඩා වැඩි කැපවීමක් සඳහා තම පටි තද කරගන්නා ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටීම" එකම විකල්පය ලෙස සඳහන් කෙරුනු බව අතාස් පෙන්වා දී ඇත.

ජූනි 24 දා පැවති පලාත් සභා වාර්ෂික රැස්වීමේදී, මධ්‍යම රජය මේ වසරේ ප්‍රතිපාදන සියයට 60 කින් කපා හැර ඇති නිසා, සංවර්ධන වැඩ සටහන් කප්පාදු කරන්නට සිදුව ඇති බවට මහ ඇමතිවරු අඳෝනා නැගූහ. මෙම තත්වය, සියලුම පාරවල්, වාරිමාර්ග, සෞඛ්‍ය සහ අධ්‍යාපන ව්‍යාපෘතිවලට බරපතල ලෙස බලපා ඇති බව ඔවුහු මාධ්‍ය වලට ප්‍රකාශ කලහ. වැඩ කරන ජනයා මතට තව දුරටත් බර පටවමින් සභාවල් නඩත්තුව සඳහා, නව බදු පැනවිය යුතු බවට ඔවුහු තීරනය කලහ.

ජූනි 27 වනදා කැබිනට් රැස්වීමේදී, මුදල් ඇමතිද වන රාජපක්ෂ, භාන්ඩාගාරයේ මුදල් තිබේදැයි පරීක්ෂා කල යුතු බව පවසමින්, බොහෝ ඇමතිවරුන්ගේ අයවැය ප්‍රතිපාදන වැඩිකිරීමේ ඉල්ලීම් ඉවත දැමීය.

ව්‍යාපාරික පිරිස්වල පවතින තැතිගැන්ම විස්තර කරමින්, පසුගිය සති අන්තයේදී සන්ඩේ ටයිම්ස් ආර්ථික තීරු ලිපි රචකයා මෙසේ ලිවීය." වැඩෙමින් පවතින දැවැන්ත අයවැය පරතරයට හේතු වී ඇත්තේ දශක ගනනාවක් පුරා කඳු ගැසුනු දැවැන්ත රාජ්‍ය නය කන්දරාවය. මැත කාලීනව සැලකියයුතු ලෙස ගොඩ ගැසුනු රාජ්‍ය නය, හුදු උත්සන්න කෙරුනු යුද්ධය නිසා මිස, සංවර්ධන වියදම් නිසා සිදුවූවක් නොවේ. යුධ වියදමේ වර්තමාන දැවැන්ත වැඩිවීම්, වර්තමාන උද්ධමනය සඳහා පමනක් නොව ඉදිරි වසරවල උද්ධමනය සඳහාද ඉන්ධන සපයයි."

ජූනි මාසය තෙක් හය මාසය දක්වා වූ වාර්ෂික උද්ධමන රේට්ටුව සියයට 17 ක් විය. මැයි මාසයේ 5166 ක් වූ කොලඹ පාරිභෝගික මිල දර්ශකය ඒකක 168 කින් ඉහල නැග ජූනි මාසයේ දී 5334 ක් විය. දශකයක ඉහලම අගය වූ සියයට 17ක් දක්වා බැංකු රේට්ටු තල්ලු කරමින් මහ බැංකුව පොලී රේට්ටු ඉහල දැම්මේය. අධික උද්ධමනය නිසා මේ වසරේ ඇ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය සියයට 8 කින් පහත වැටිනි.

ආන්ඩුව වැඩි වැඩියෙන් කෙටි කාලීන පැලැස්තර දැමීමේ උත්සාහයක නිරතව සිටී. ගිය වසර පුරාවට රුපියල් බිලියන 384 මුදල් නිපැයූවේය. ඒ සමගම ජූනි වන විට රටතුලින්ම සහ අන්තර්ජාතිකව රුපියල් බිලියන 406 (ඇ. ඩොලර් බිලියන 4) ක අතිවිශාල මුදලක් නයට ගෙන ඇත.

ආර්ථික විශේෂඥ හර්ෂ ද සිල්වා ජූලි පලමුවනදා සන්ඩේ අයිලන්ඩ් පුවත්පතට අනතුරු අඟවමින් කියා සිටියේ "අපි විශාල නය උගුලකට හසුවෙමින් සිටිමු" යනුවෙනි. ශ්‍රී ලංකාව දැනට පවතින නය ගෙවීම සඳහා කෙටි කාලීන නය ගැනීම් සිදු කරයි. එක් නයක් ගෙවා නිම කල සැනින් තවත් නයක් ලබා ගනී. ඉහල යන නය ආපසු ගෙවීම් අයවැය පරතරය වැඩි කරන සුවිශේෂී සාධකය බවට පත්ව ඇත. පසුගිය වසරේදී දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 8.4 ක්වූ අයවැය පරතරය මෙම වසරේදී සියයට 9.2 දක්වා ඉහල යනු ඇතැයි, පුරෝකථනය කර ඇත .

ලෝක සමාජවාදී වෙබ් අඩවිය පවතින ආර්ථික තත්වය පිලිබඳව සාමාන්‍ය වැඩ කරන ජනතාවගෙන් විමසන ලදී.

හැටන් ආසන්නයේ ඇති පන්මුරේ තේ වතුයායේ පදිංචි මුනියන්ඩු සිවනු ප්‍රකාශ කලේ "රාජපක්ෂ ආන්ඩුව බලයට පැමිනියේ දුප්පත් මිනිසුන්ගේ ජීවන තත්වය ඉහල නංවන බවට පොරොන්දු වෙලා. නමුත් දැන් තත්වය වඩාත් නරක අතට හැරිලා. මෙම ආන්ඩුව විසින් වතු කම්කරුවන් වැඩි කොටසක් භාවිතා කරන තිරිඟු පිටි සහ භූමිතෙල් මිල ඉහල දමලා."

"මාස කීපයකට කලින් මම පිටි කිලෝව රු. 32 කට මිලදී ගත්තා. දැන් එය රු. 49 ක් 55 ක් අතර මිලකට පවතිනවා. අපි කොහොමද ජීවත් වන්නේ. අපේ ආහාරය සඳහා හැම මාසෙකම පිටි කිලෝ 15 ක් හා හාල් කිලෝ 15 ක් අවශ්‍ය වෙනවා. මේ ඉහල යන මිල නිසා අපට අපගේ කෑම වේලවල් කපා හැරීමට සිදුවෙලා. මට අවු. 5 ක සහ අවු. 1 ක දරුවන් දෙදෙනෙක් ඉන්නවා. සාමාන්‍යයෙන් අපි සෑම මසකම ග්‍රෑම් 400 පිටිකිරි පැකට්ටුවක් මිලදී ගන්නවා. මෙම මිල දැන් රු. 180 වේ සිට රු. 210 දක්වා වැඩිවී තිබෙනවා."

"මම කඳුරට ජනතා පෙරමුනේ සාමාජිකයෙක්. මෙහි නායක ජී. චන්ද්‍රසේකරන් මෙම ආන්ඩුවේ ඇමතිවරයෙක්. නමුත් ඔහු මෙම මිල ඉහල යාම් පිලිබඳව

වචනයක්වත් නොකියා නිශ්ශබ්දව ඉන්නවා. මෙම රජය අනවශ්‍ය යුද්ධයකට අති විශාල මුදලක් වැය කරනවා. මෙම යුද්ධය දිගටම පැවතුනොත් අපේ ජීවන බර තවත් ඉහල යාවි. අපේ තත්වයන් ආරක්ෂාකරගැනීමට නම්, මෙම යුද්ධය ඉතා ඉක්මනින් නැවැත්විය යුතුයි."

හැටන් ප්‍රදේශයේ වතු කම්කරු කාන්තාවක් වන උමා පැවසුවේ, "මෙම රජය රු 300 ක දිනක වැටුප සඳහා වූ අපේ ඉල්ලීම් ප්‍රතික්ෂෙප කලා. දින පහලොවකටත් වඩා වැඩ වර්ජන වල යෙදීමෙන් අපට ලැබුනේ රු 170 ක වැටුපක් පමනයි. මෙය තේරුමක් නැති දෙයක්. මිල ගනන් දිනපතා ඉහල යනවා. වර්ජනයෙන් පසු විවිධ ක්‍රියාමාර්ග යොදා ගනිමින් කලමනාකරනය තම ලාභය වැඩි කර ගත්තා. ඒත් අපේ ජීවන තත්වය ඉතා නරක අතට හැරුනා."

"ඔවුන් උදෑසන 6 සිට 8 දක්වා වූ නව වැඩ මුරයක් හඳුන්වා දී තිබෙනවා. තේ දළු කිලෝවක් සඳහා ගෙවනු ලබන්නේ රු 10 ක් පමනයි. එම නිසා අපට උදෑසන 8 සිට හවස 5 දක්වා තේ දළු නෙලන්නට සිදුවී තිබෙනවා. මට කුඩා දරුවෝ දෙදෙනෙක් සිටිනවා. එම නිසා අමතර වැඩ මුරයක් කිරීම ඉතාම අපහසුයි. එහෙත් අපේ වැටුප ඉතා අල්ප බැවින් අමතර වැඩ කිරීමට අපට සිදුව තිබෙනවා. අපේ වැටුප අපේ ආහාර සඳහාවත් ප්‍රමානවත් නෑ."

ඥානසීලි, වසර තුනක් පමන කාලයක සිට මොරටුව ප්‍රදේශයේ මැෂින් ඔපරේටර්වරියක් ලෙස සේවය කරයි. ඇගේ මූලික වැටුප රු. 6,500 (ඇ. ඩොලර් 58) වන අතර, අදාල මාසයේ නිවාඩු ලබා නොගතහොත් රු. 1,000 ක පැමිනීමේ දීමනාවක්ද ගෙවනු ලබයි. සේවකයකුට කෑම සඳහා පමනක් අවම වශයෙන් රු. 10,000 ක් අවශ්‍ය බව ඇය පැහැදිලි කරන ලදී.

"බොහොමයක් සේවකයෝ තම කාමර හවුලේ භාවිතා කරන අතර ආහාර සැකසීමද සමූහ වශයෙන් සිදුකරනවා. තම ප්‍රධාන ආහාර වේල සඳහා බත් සහ එක් ව්‍යංජනයක් පමනක් යන්තමින් දරා ගැනීමට පමනයි ඔවුනට හැකියාව ඇත්තේ. මන්දපෝෂනය නිසා ඇතිවන රෝග තත්වයන්ගෙන් බොහෝ සේවකයෝ පීඩා විඳිනවා. සුදුසු ආහාර නොමැතිව, නොකඩවා තම දෑත් අධික ලෙස යෙදවීම නිසා ඔවුහු තම අත්වල ඇති වේදනාව ගැන පැමිනිලි කරනවා."

"අප කෑම පිසින්නේ භූමිතෙල් භාවිතා කරලා. දරාගත නොහැකි මට්ටමට මිල වැඩිවීම් සිදු වුවත් අපේ වැටුප් එක ශතයකින්වත් පසුගිය වසරවල වැඩි වී නෑ. බොහෝ සේවකයන් අවිවාහක කාන්තාවන්. ඔවුන්ට තම අනාගතය සඳහා යම් මුදලක් ඉතිරි කිරීමට අවශ්‍යයි. කෙසේවුවත්, මෙය අපගේ ස්වල්ප වැටුපෙන් කිසිදා සැබෑ කර ගත නොහැකි සිහිනයක් වී තිබෙනවා. මෙම තත්වය යටතේ සමහර සේවකයන් සේවයෙන් අස් වී තම ගම් නගර කරා ගොස් තිබෙනවා."

"යුද්ධය මෙම බරපතල තත්වය නිර්මානය කර තිබෙනවා. එක් අතකින් යුද්ධය ජනයා ඝාතනය කරනවා. අනෙක් අතින් රජය මේ රටේ සියලු ආදායම් යුද්ධයට වැය කරනවා. වැඩ කරන ජනතාව වන අපට සියලු බර දරා ගැනීමට සිදු වෙලා. රජය වැඩ කරන ජනතාවගේ ජීවන තත්වය විනාශ කරන අතරම මහජන මුදල් නාස්ති කරනවා."

© www.wsws.org